"කාර්යක්ෂමතාවයෙන් යුත් පළාත් රාජ්‍ය සේවයක්"

ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
ஊவா மாகாண அரசாங்க சேவை ஆணைக்குழு
**Uva Provincial Public Service Commission**

අංක 199, කැප්පෙටිපොල පාර, බදුල්ල. இல. 199, கெப்பெட்டிபொல வீதி, பதுளை. No. 199, Keppetipola Road, Badulla.

මගේ අංකය / எனது இல / My No. 3/PA/C/ 1-42 ඔබේ අංකය / உமது இல / Your No. ............ දිනය / திகதி / Date 2009-12-03

ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
බදුල්ල.

**ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය / ආයුර්වේද දෙපාර්තමේන්තුවේ රෝහල් ඕවසියර් , සුළු සේවා පාලක තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිය.**

ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය / ආයුර්වේද දෙපාර්තමේන්තුවේ රෝහල් ඕවසියර්,සුළු සේවා පාලක තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇත.

02. ඒ අනුව යථෝක්ත පරිපාටියේ පිටපතක් බඳවා ගැනීම් හා උසස් වීම් කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

(නිරෝෂා දීපනි රත්වත්ත)
සහකාර ලේකම්/ලේකම් වෙනුවට
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත-

01. ප්‍රධාන ලේකම් - අනුමත බඳවා ගැනීමේ පිටපතක් මේසමඟ එවමි.
02. ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ - අනුමත බඳවා ගැනීමේ පිටපතක් මේ සමඟ එවමි.
03. ඌව පළාත් ආයුර්වේද කොමසාරිස් - අනුමත බඳවා ගැනීමේ පිටපතක් මේ සමඟ එවමි.

සභාපතිතුමා / தலைவர் / Chairman 055 - 2222150
ලේකම් / செயலாளர் / Secretary 055 - 2223482
සහකාර ලේකම් / உதவிச்செயலாளர் / Asst.Secretary 055 - 2225148
නිවස / இல்லம் / Residence 057 - 2222744
ෆැක්ස් / பெக்ஸ் / Fax 055 - 2223482
පරිපාලන නිලධාරී / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer 055 - 2222400
E-Mail : uppscb@sltnet.lk

# ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ/ආයුර්වේද දෙපාර්තමේන්තුවේ රෝහල් ඕවසියර්/ සුළු සේවා පාලක තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය

01. තනතුරු නාමය - රෝහල් ඕවසියර් / සුළු සේවා පාලක

02. තනතුර අයත් දෙපාර්තමේන්තුව :- ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව/ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

අමාත්‍යාංශය ඌව පළාත් සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශය

03. ක්‍රියාත්මක වන දිනය - 2006.0 1.0 1

04. අර්ථ නිරූපණ

04.1 බඳවා ගැනීමේ පරිපාටිය යන පදයෙන් අදහස් වන්නේ ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රෝහල් ඕවසියර්/සුළු සේවා පාලක තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය වේ.

04.2 කොමිෂන් සභාව යනුවෙන් අදහස් වන්නේ ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

04.3 ප්‍රධාන ලේකම් යන පදයෙන් අදහස් කරන්නේ ඌව පළාත් ප්‍රධාන ලේකම්වරයා වේ.

04.4 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් යන පදයෙන් අදහස් කරන්නේ ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වේ.

04.5 අමාත්‍යාංශ ලේකම් යන පදයෙන් අදහස් කරන්නේ ඌව පළාත් සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

04.6 දෙපාර්තමේන්තු ප්‍රධානියා යනු ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ/ ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පළාත් ආයුර්වේද කොමසාරිස් වේ.

04.7 සේවාව යන පදයෙන් අදහස් කරන්නේ, ඌව පළාත් රාජ්‍ය සේවයේ රෝහල් ඕවසියර්/ සුළු සේවා පාලක සේවය වේ.

04.8 " නියමිත දිනය" යනුවෙන් අදහස් කරනුයේ මෙම සේවයට / බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක කිරීම ආරම්භ වන දිනය වේ.

04.9 මෙම බඳවා ගැනීමේ පරිපාටියට අදාළ කාර්යයන් සඳහා "සතුටුදායක සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ උසස්වීම් සඳහා ඉල්ලුම් කරන දිනට පූර්වාසන්න වසර 05 ක සේවා කාලය තුළ සියළුම වැටුප් වර්ධක ලබා ඇත්තා වූද ඒ කාලය තුළ කළ වරදකට අවවාද කිරීමක් හෝ තදින් අවවාද කිරීමක් හැර දඬුවමක් නැත්තා වූද සේවා කාලයකි.

05. තනතුරේ සාරාංශය

වෛද්‍ය ශිල්ප ක්‍රම උපයෝගි කර ගනිමින් ඌව පළාත තුළ සෞඛ්‍ය සම්පන්න හා නිරෝගිමත් ජනතාවක් බිහි කිරීම උදෙසා සේවාවන් විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට හැකි වන පරිදි රෝහල් කණිෂ්ඨ කාර්ය මණ්ඩලය මෙහෙයවීම හා අධීක්ෂණය .

## 06. සේවා කොන්දේසි :-

06.1 මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු,අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක වි[illegible] යුතුය.

06.2 තෝරා ගනු ලබන්නන් ආයතන සංග්‍රහය, පළාත් සභා මුදල් රීති සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග / රෙගුලාසි හා රජය මගින් හෝ ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් දැනට නිකුත් කර ඇති හා කලින් කළ නිකුත් කරනු ලබන වෙනත් නියෝග හෝ රෙගුලාසි වලට යටත් විය යුතුය.

06.3 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 ප්‍රකාරව පත්වීමේ දින සිට වසර පහක් (05) තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

06.4 ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා ඡේද වල විධි[illegible] අදාළ වේ.

06.5 රෝහල් ඕවසියර්/ සුළු සේවා පාලක තනතුරට තෝරා ගනු ලබන සේවක/ සේවිකාවට ස[illegible] දෙකක පුහුණුවක් ලබා දෙනු ලැබේ.

## 07. වැටුප් ක්‍රමය හා සේවක ව්‍යුහය :-

7.1 සේවක ගණය හා වර්ගීකරණ මට්ටම්
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව
ප්‍රාථමික - අර්ධ ශිල්පීය

7.2 සේවක ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය
PL 2 – 2006 – රු. 12 140 – 10 x 110 – 10 x 120 – 10 x 130 – 12x 140 – 17 420/-

7.3 සේවක ගණයට අදාළ ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක මාසික වැටුප් පියවර

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් පරිමාණය | ආරම්භක වැටුප | වැ[illegible] අංකය |
|---|---|---|---|---|
| III | පියවර 01 | රු. 12 140 – 10 x 110 – 10 x 120 – 10 x 130 – 12x 140 – 17420/- | රු. 12 140/- | PL -[illegible] 2 - 2[illegible] |
| II | පියවර 12 | රු. 12 140 – 10 x 110 – 10 x 120 – 10 x 130 – 12x 140 – 17420/- | රු. 13360/- | |
| I | පියවර 22 | රු. 12 140 – 10 x 110 – 10 x 120 – 10 x 130 – 12x 140 – 17420/- | රු. 14570/- | |
| විශේෂ ශ්‍රේණිය | පියවර 32 | රු. 12 140 – 10 x 110 – 10 x 120 – 10 x 130 – 12x 140 – 17420/- | රු. 15880/- | |

7.4 සේවක ව්‍යුහය

එක් එක් ශ්‍රේණිය සඳහා වෙන් වු සේවක සංඛ්‍යාවක් නොමැත. III, II, I සහ විශේෂ ශ්‍රේණි[illegible] සිය ඒකාබද්ධ සේවක සංඛ්‍යාවට අයත් වේ.

**08. බඳවා ගැනීමේ සුදුසුකම්**

**8.1.1 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 හි PL – 2 තනතුරු දරණ පහත සඳහන් ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් මේ යටතේ අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

I. රෝහල් උපස්ථායක
II. කිට විද්‍යා ක්ෂේත්‍ර උපස්ථායක
III. ඉයිම් යන්ත්‍ර ක්‍රියාකරුවන්
IV. රසායනාගාර සේවක II ශ්‍රේණිය
V. රසායනාගාර ඕවර්ලිවරුන් සහ කම්කරුවන්
VI. අරක්කැමි
VII. යන්ත්‍ර ක්‍රියාකරු
VIII. ටිකට් ලිපිකරු
IX. අඳුරු කාමර සහායක
X. පොම්ප ක්‍රියාකරු / ජල නල කාර්මික
XI. දුරකථන ක්‍රියාකරු

(ආ) **අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා තිබිය යුතු පූර්ව අවශ්‍යතා**

* තමා දැනට දරණ තනතුරේ ස්ථිර කර තිබීම.
* අයදුම්පත් කැඳවන දිනට සතුටුදායක පස් වසරක සේවා කාලයක් සපුරා තිබීම.

**8.1.2 බාහිර අයදුම්කරුවන් සඳහා :-**

(අ) **අධ්‍යාපන සුදුසුකම් :-**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල / දෙමළ භාෂාව හෝ සාහිත්‍ය, අංක ගණිතය/ ගණිතය/ වාණිජ අංක ගණිතය ඇතුළු විෂයන් 06 කින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත් වී තිබීම හෝ භාෂාව, ගණිතය ඇතුළුව විෂයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයෙන් සමත් වී තිබිය යුතුය.

**8.3 පොදු යෝග්‍යතා :-**

8.3.1. යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය.

8.3.2. ඌව පළාත තුළ අවම වශයෙන් අවුරුදු 03 ක වත් ස්ථිර පදිංචිය තිබිය යුතුය. ඡන්ද හිමි නාම ලේඛනය මගින් පදිංචිය සනාථ කළ යුතුය.

8.3.3 බඳවා ගැනීමට අදාළව අයදුම්පත් කැඳවන දිනට හෝ නියම කරනු ලබන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවෙකුට එනම් ඒ වන විටත් රාජ්‍ය සේවයේ හෝ ඌව පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයෙක් නම් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**09. බඳවා ගැනීමේ ක්‍රමය :-**

රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවීම ද ... සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරනු ලැබේ. ... හා ප්‍රායෝගික පරීක්ෂණයේ ප්‍රතිඵල මත වැඩිම ලකුණු ලබා ගැනීමේ පදනම මත බඳවා ... ලැබේ.

(I) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය උාව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍ය ... ලේකම් විසින් පත් කරනු ලැබේ.

<u>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මැනීමේ නිර්ණායක</u>

9.1 අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගනු ලබන්නේ ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත වේ.

ජ්‍යෙෂ්ඨතාවයට ලකුණු 60 ක් ද කුසලතාවයට ලකුණු 40 ක්ද වන පරිදි උපරිම ලකුණු 100 කි.

ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු 60 කි. පහත සඳහන් නිර්ණායක පදනම් කර ගනිමින් ලකුණු ... ලැබේ.

| කාලය | ලකුණු ප්‍රමාණය |
|---|---|
| පරිවාස සේවා කාලයට පසු වසරකට | 4 |
| පරිවාස සේවා කාලයට පසු මාස 6 - 12 | 3 |
| පරිවාස සේවා කාලයට පසු මාස 3 - 6 | 1 |

මාස 03 කට අඩු කාලයකට ලකුණු දෙනු නොලැබේ.

කුසලතාවය සඳහා ලකුණු 40

කුසලතාවය මැනීමේ නිර්ණායක

1. වෘත්තීය දැනුම පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය - ලකුණු 20
2. සාමාන්‍ය දෛනික රාජකාරි සඳහා අදාළ වන ආයතනික දැනුම පිළිබඳ වාචික පරීක්ෂණය - ලකුණු 20

අපේක්ෂකයින් අතුරින් උපරිම ලකුණු ලබා ගැනීමේ ප්‍රමුඛතාවය මත සුදුස්සන් තෝරා ගනු ...

9.2 බාහිර අයදුම්කරුවන් සඳහා විභාග විෂය නිර්දේශය

| <u>විෂය</u> | <u>කාලය</u> | <u>ලකුණු</u> |
|---|---|---|
| 1. අභියෝග්‍යතාවය | පැය 1 | 100 |
| 2. සාමාන්‍ය දැනුම | පැය 1 1/2 | 100 |
| | | 200 |

1. අභියෝග්‍යතාවය

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ භාෂාමය කුසලතාවය, සංඛ්‍යාමය හැකියාව, තර්කානුකූල ශක්තිය, විශ්ලේෂණ හැකියාව, කඩිනමින් තීරණ ගැනීමේ හැකියාව ආදිය මැනීම සඳහා සකස් කළ ප්‍රශ්න පත්‍රයකි.

2. සාමාන්‍ය දැනුම

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ප්‍රාදේශිය හා ජාතික මට්ටමේ සමාජ, ආර්ථික, දේශපාලන තොරතුරු ඇතුළත් කරනු ලැබේ.

9.3 අපේක්ෂකයින් අතුරින් ලකුණු ලබා ගැනීමේ ඉහළම ප්‍රමුඛතාවය මත සුදුස්සන් තෝරා ගනු ලැබේ. මෙම විභාගය ඌව පළාත් සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වනු ලැබේ.

## 10. කාර්යක්ෂමතා කඩඉම්

10.1 (අ) පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය අදාළ සේවයේ III වන ශ්‍රේණියට පත්වී වසර 03 ක් ඇතුළත සමත් විය යුතුය.

(ආ) දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය අදාළ සේවයේ II ශ්‍රේණියට පත්වී වසර 03 ක් ඇතුළත සමත් විය යුතුය.

(ඇ) තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සේවයේ I ශ්‍රේණියට පත් වී වසර පහක් (05) ක් ඇතුළත සමත් විය යුතුය.

(ඈ) කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සඳහා එක් එක් විෂයට අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතුය.

10.2 ඌව පළාත් සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පවත්වනු ලැබේ. මෙම විභාගය අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක්වත් පවත්වනු ලැබේ.

10.3 ඉහත සඳහන් පරිදි නියමිත කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් නොවන තැනැත්තන් පිළිබඳව ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලැබේ.

10.4 <u>I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය නිර්දේශය</u>

මෙය ලිඛිත පරීක්ෂණයකි. විභාගයේ විෂය නිර්දේශය පහත පරිදිය.

| විෂය | කාලය | ලකුණු |
|---|---|---|
| 1. ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ II, III, IV, VII, VIII,XII, XIII, XIV; XV, XVIII හා ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේද | පැය 02 | 100 |
| 2. පළාත් සභා මුදල් රීති සංග්‍රහය මු.නි.475, 530, 546 සිට | පැය 01 | 100 |
| මුළු ලකුණු | | 200 |

මෙම විභාගයේ එක් එක් විෂයට වෙන වෙනම ද පෙනී සිටිය හැකිය.

[illegible]

## 10.5 II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය නිර්දේශය

මෙය ලිඛිත පරීක්ෂණයකි. විභාගයේ විෂයයන් පහත දැක්වෙන පරිදි වේ.

| | විෂය | කාලය | ලකුණු |
|---|---|---|---|
| 1. | කාර්යාල ක්‍රම | පැය 02 | 100 |
| 2. | පළාත් මුදල් රීති සංග්‍රහය | පැය 0 1 | 100 |
| | මුළු ලකුණු | | 200 |

1. **කාර්යාල ක්‍රම**

   ආයතන සංග්‍රහයේ පළමු බාණ්ඩයේ පහත සඳහන් පරිච්ඡේද වල විධි විධාන පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ.

   II, V, VIII, XII, XIII, XXII, XXIII, XXV, XXVIII

2. **පළාත් මුදල් රීති සංග්‍රහය**

   මු.නි.5 1, 52, 54, 55, 144, 154, 2 15, 2 16 පරිච්ඡේද වල විධි විධාන පිළිබඳව දැනුම පරීක්ෂා කෙරේ.

මෙම විභාගයේ එක් එක් විෂයට වෙන වෙනම ද පෙනී සිටිය හැකිය.

## 10.6 III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය නිර්දේශය

ලිඛිත පරීක්ෂණයකි. විභාගයේ විෂයන් පහත දැක්වෙන පරිදි වේ.

| | විෂය | කාලය | ලකුණු |
|---|---|---|---|
| 0 1. | **ආයතන සංග්‍රහය**<br>ආයතන සංග්‍රහයේ I වන කාණ්ඩයේ II, III, IV,VII, VIII, XII,XIII, XIV XV, XVIII හා II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ | පැය 1 | 100 |
| 02. | **පළාත් සභා මුදල් රීති සංග්‍රහය**<br>මු.නි.475, 530, 546 - 555 දක්වා ද 560, 562 පරිච්ඡේද වල විධි විධාන පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ. | පැය 1 | 100 |
| | මුළු ලකුණු | | 200 |

මෙම විභාගයේ එක් එක් විෂයට වෙන වෙනම ද පෙනී සිටිය හැකිය.

19

**11. උසස් වීම් :-**

කාර්ය සාධනය පදනම් කර ගත් පහත දැක්වෙන ආකාරයේ උසස් වීම් ක්‍රමයක් හිමි වේ.

**11.1 සේවක ගණයෙහි III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.**

**11.1.1 සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්**

(අ) පූර්ව අවශ්‍යතා

I. පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කිරීම.

II. සේවක ගණයේ III ශ්‍රේණියේ වසර දහයක ( 10) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාළ කාලයට නියමිත වැටුප් වර්ධක සියල්ල උපයා ගෙන තිබීම.

III. රාජ්‍ය පරිපාලන 8/98 චක්‍රලේඛ අනුව කාර්ය සාධන වාර්තා අනුව පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක මට්ටම හෝ රට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. රා.ප.ච. 3/2007 හා 7/2007 චක්‍රලේඛය අනුව අදාළ මට්ටමේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම.

V. I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

(ආ) උසස් වීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින්ගෙන් උසස්වීම සඳහා අයදුම්පත් ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් කැඳවනු ලැබේ. දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අදාල අයදුම්පත් ඉදිරිපත් කරනු ලැබූ පසු අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයකට යොමු කර, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු II ශ්‍රේණියට උසස් කිරීම ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ.

**11.1.2 සුවිශේෂී කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්**

(අ) පූර්ව අවශ්‍යතා

I. පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කර තිබීම.

II. සේවක ගණයේ III ශ්‍රේණියේ වසර හයක (06) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. උසස් වීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම .

IV. රාජ්‍ය පරිපාලන 8/98 චක්‍රලේඛ අනුව කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව පූර්වාසන්නතම වසර හය (06) තුළ සතුටුදායක මට්ටමට ඉහළ සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

V. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2007 හා 7/2007 චක්‍රලේඛය අනුව අදාළ මට්ටමේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම.

VI. I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

VII. II ශ්‍රේණියේ උසස් කිරීමේ විභාගය සමත්ව තිබීම.

**<u>සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් වීම සඳහා විභාග විෂය නිර්දේශය</u>**

**මෙම පරීක්ෂණය කොටස් තුනකි.**

1. **ලිඛිත පරීක්ෂණය**
2. **වාචික පරීක්ෂණය**
3. **රාජකාරී වැඩ, පැමිණීම හා හැසිරීම පරීක්ෂා කිරීම.**

1. ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය

| | විෂය | කාලය | ලකුණු |
|---|---|---|---|
| * | **ආයතන සංග්‍රහය පිළිබඳ සාමාන්‍ය දැනුම** ආයතන සංග්‍රහයේ II, VII, XII සහ ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII පරිච්ඡේද මත ප්‍රශ්න පත්‍ර සැකසේ. | පැය 02 | 50 |
| * | **වාචික පරීක්ෂණය** අදාළ සේවකයාට පැවරෙන සියළුම කාර්යයන් මැන බැලීම සඳහා වාචික පරීක්ෂණයකි. මේ යටතේ භාෂාමය හැකියාව, පෞරුෂත්වය, තීරණ ගැනීමේ ස්වරූපය මැන බලනු ලැබේ. | මිනිත්තු 10 | 30 |
| * | **රාජකාරී වැඩ, පැමිණීම හා හැසිරීම** වැඩ, පැමිණීම හැසිරීම සඳහා ලකුණු අදාළ ආයතන ප්‍රධානීන් වෙතින් ලබා ගන්නා රහස්‍ය වාර්තා මගින් තීරණය කරනු ලැබේ. | | 20 |
| | මුළු ලකුණු | | 100 |

11.1.3 මෙම ලිඛිත හා වාචික පරීක්ෂණය ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසි පවත්වනු ලැබේ. මෙම විභාගයෙන් සමත් වීමට ලකුණු 50% ක් ලබා ගත යුතුය.

11.1.4 සුවිශේෂී කාර්ය සාධනය යටතේ පවත්වනු ලබන උසස් කිරීමේ විභාගය සඳහා පෙ සිටිය හැක්කේ එක් වරක් පමණි.

(ආ) උසස් වීමේ ක්‍රමය

සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම් විභාගය සමත් හා අනිකුත් පූර්ව සුදුසුකම් සම්පූර්ණ කරන ලද සේවකයින් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉල්ලීම් කරනු ලැබූ විට සම්මුඛ පරීක්ෂණයකින් පසු ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු උසස්වීම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ.

11.2 සේවක ගණයෙහි II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

11.2.1 සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

(අ) පූර්ව අවශ්‍යතා

I. සේවක ගණයේ II ශ්‍රේණියේ වසර දහයක (10) සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

II. උසස්වීම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) ක කාලයක් තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/98 කාර්ය සාධන ඇගයීම් වාර්තා අනුව සතුටුදායක මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

V. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2007 හා 7/2007 අනුව අදාල මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

(ආ) උසස් වීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින්ගෙන් උසස්වීම සඳහා අයදුම්පත් ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් කැඳවනු ලැබේ. දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් වෙත අදාල අයදුම්පත් ඉදිරිපත් කරනු ලැබූ පසුසෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයකට යොමු කර, සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයෙන් පසුව I ශ්‍රේණියට උසස් වීම් ලබා දීම ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විෂයභාර ලේකම් විසින් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ.

11.2.1 සුවිශේෂී කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

(අ) පූර්ව අවශ්‍යතා

I. සේවක ගණයේ II ශ්‍රේණියේ වසර අටක(08) සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

II. උසස්වීම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) ක කාලයක් තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්න කර තිබීම.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/98 කාර්ය සාධන වාර්තා අනුව පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමට ඉහළ සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

V. I ශ්‍රේණියට උසස් කිරීමේ පරීක්ෂණයෙන් සමත් වී තිබීම.

**I වන ශ්‍රේණියට උසස් කිරීමට අදාළ අභියෝගතා පරීක්ෂණයේ විෂය නිර්දේශය**

මෙම පරීක්ෂණය කොටස් 02 කි

1. ආයතන සංග්‍රහය
2. පළාත් මුදල් රීති සංග්‍රහය

| විෂය | කාලය | ලකුණු |
|---|---|---|
| * **ආයතන සංග්‍රහය**<br>ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ II, VIII, VII, XII, XIII, XIV සහ ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII, XLVIII පරිච්ඡේද මත ප්‍රශ්න පත්‍රය සැකසේ. | පැය 02 | 100 |
| * **පළාත් මුදල් රීති සංග්‍රහය**<br>මු.නි.51, 52, 54, 55 යන පරිච්ඡේද මත ප්‍රශ්ණ පත්‍ර සැකසේ | පැය 01 | 100 |
| | | 200 |

11.2.3 මෙම විභාගයෙන් සමත් වීම සඳහා එක් එක් විෂයට ලකුණු 50% ක් ලබා ගත යුතුය. මෙම ලිඛිත විභාගය ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වනු ලැබේ.

11.2.4 සුවිශේෂී කාර්ය සාධනය යටතේ පවත්වනු ලබන උසස් කිරීමේ විභාගය සඳහා පෙනී සිටිය හැක්කේ එක් වරක් පමණි.

(ආ) උසස්වීමේ ක්‍රමය

පූර්ව සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින්ගෙන් ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විෂයභාර ලේකම් විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විෂයභාර ලේකම් විසින් උසස්වීම් කරනු ලැබේ.

11.3 **සේවක ගණයෙහි I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම**

11.3.1 සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

(අ) පූර්ව අවශ්‍යතා

I. සේවක ගණයේ I ශ්‍රේණියේ වසර දහයක( 10) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

II. පූර්වාසන්න වසර පහ (05) ක කාලයක් තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/98 යටතේ අනුමත කාර්ය සාධන වාර්තා අනුව පූර්වාසන්න වසර දහය (10) තුළ සතුටුදායක මට්ටමට ඉහළ සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා I වන ශ්‍රේණියේ වසර 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින්ගේ ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත පුරවනු ලැබේ. I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ දී ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මැනීමට පහත දැක්වෙන නිර්ණායක උපයෝගී කර ගනු ලැබේ. ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු 50 ක්ද කුසලතාවය සඳහා ලකුණු 50 ක්ද වන පරිදි උපරිම ලකුණු සංඛ්‍යාව 100 කි.

| | | |
|---|---|---|
| **ජ්‍යෙෂ්ඨතාවය**<br>මූලික සුදුසුකම් සැපිරූ කාලයට පසු I වන ශ්‍රේණියේ සේවා කාලයට ලකුණු 05 බැගින් වසර 10 ක උපරිමයට | | ලකුණු 50 |
| **කුසලතාවය** | | ලකුණු 50 |
| කාර්ය සාධනය (පූර්ව වසර 5 සඳහා ) | | |
| ඉතා හොඳයි | - | 15 |
| හොඳයි | - | 10 |
| සතුටුදායකයි | - | 05 |
| ඉංග්‍රීසි හෝ දෙමළ දැනුම භාවිතය පුහුණු පාඨමාලාවලට සහභාගී වීම (දිනකට වැඩි පුහුණු පාඨමාලාවකට 2 බැගින් උපරිම වැඩසටහන් 05) | - | 10 |
| විශේෂ ඇගයීම් වාර්තා (ඇගයීම් / ප්‍රශංසා වාර්තාවකට ලකුණු 2 බැගින් උපරිම 5) | - | 10 |

(ආ) උසස්වීමේ ක්‍රමය

පූර්ව සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් වෙතින් ඌව පළාත් ප්‍රධාන ලේකම් විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. සුදුසුකම් පරීක්ෂා කර උසස්වීම් ලබා දීම සෞඛ්‍ය, දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරනු ලැබේ.

12. පාලනය

ඌව පළාත් රාජ්‍ය සේවයේ රෝහල් ඕවසියර් / සුළු සේවා පාලක තනතුරු මෙම බඳවා ගැනීමේ පරිපාටියෙන් පාලනය වේ. විධි විධාන සළසා නොමැති කරුණු පිළිබඳ ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් මත ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

**13. අන්තර්කාලීන විධි විධාන යටතේ අන්තර්ග්‍රහණය කිරීම් :-**

නියමිත දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 මගින් ලබා දී ඇති PL – 2 – 2006 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන සේවකයින් සියළු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ විධි විධානවලට යටත්ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කරගෙනය.

I. PL – 2 – III ශ්‍රේණිය

(අ) PL – 2 – 2006 වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්

(ආ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක් හෝ රට වැඩි සේවා කාලයක් සම්පූර්ණ වුවද II,I හෝ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

PL – 2 – III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

II. PL – 2 – II ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක හෝ රට වැඩි එහෙත් අවුරුදු 20 ට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ආ) PL – 2 – 2006 වැටුප් පරිමාණයෙහි II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක කාලයක් සම්පූර්ණ කර නැති සේවකයන්.

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර 10 ක් රට වැඩි සේවා කාලයක් සම්පූර්ණ වුවද I හෝ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

PL – 2 – II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

III. PL – 2 – I ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 20 ක් හෝ රට වැඩි එහෙත් අවු 30 කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක් හෝ රට වැඩි එහෙත් අවුරුදු 20 කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති , එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ඇ) PL – 2 – 2006 වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්.

16



(ඈ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර 10 ක් සම්පූර්ණ වුවද විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

PL - 2- I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

IV. PL - 2 - **විශේෂ ශ්‍රේණිය**

(අ) ඉහත සඳහන් III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 30 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ආ) ඉහත සඳහන් II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 20 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ඇ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ඈ) PL - 2 - 2006 වැටුප් පරිමාණයෙහි විශේෂ ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක් යටතේ වැටුප් ලබන සේවකයින්.

PL - 2- විශේෂ ශ්‍රේණියට 2008.07.01 දිනට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

* මෙම එක් එක් ශ්‍රේණිය සඳහා උසස් වීමට 2010.01.01 දින සිට 2012.12.31 දක්වා කාලය තුළ සුදුසුකම් සපුරාලන අයවේ නම් ඔවුන්ට පෞද්ගලික වන සේ අදාළ කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් වීම සඳහා වසර 03 ක සහන කාලයක් ලබා දීමට විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අභිමතය පරිදි කටයුතු කළ හැක.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 විධි විධාන ප්‍රකාර සංශෝධන ඇතුළත් කර ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ/ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ රෝහල් ඕවසියර් / සුළු සේවා පාලක බඳවා ගැනීමේ සකස් කරන ලද පරිපාටිය බව සහතික කරමු. අනුමැතිය සඳහා ඉදිරිපත් කරමු.

31/08/2009
..................
දිනය

..................
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ(ඌව)
නිල මුද්‍රාව

31/08/2009
..................
දිනය

..................
පළාත් ආයුර්වේද කොමසාරිස්
නිල මුද්‍රාව
පී.ඩබ්ලිව්. ඩබ්ලිව්. [illegible]

**අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය :-**

නිර්දේශ කරමි/ නොකරමි

අංකය :- 5/ආ/1/30

දිනය :- 2009.09.30

අත්සන :-

(නිල මුද්‍රාව)

**ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :-**

නිර්දේශ කරමි/ නොකරමි

අංකය :- 4/20/3/7/1/7

දිනය :- 2009.10.

අත්සන :-

පී.බී. අමරසේකර
ප්‍රධාන ලේකම්, ඌව පළාත

**ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :-**

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව අනුමත කරමි

1. සභාපති :-
2. සාමාජික :-
3. සාමාජික :-
4. සාමාජික :-
5. සාමාජික :-

දිනය :- 2009-10-27

**ආණ්ඩුකාරවර ලේකම්**

2009-10-27. දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක (13) යටතේ කොමිෂන් සභාව අනුමත කරන ලද ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ/ ආයුර්වේද දෙපාර්තමේ රෝහල් ඕවසියර් / සුළු සේවා පාලක තනතුරු සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය ගරු ආණ්ඩුකාර අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

ලේකම්,
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදිය

අනුමත කරමි/නොකරමි

( සි.නන්ද මැතිව්)
ඌව පළාත් ආණ්ඩුකාරවර

දිනය :- 2009.11.23